අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2002 අගෝස්තු
General Certificate of Education(Advanced Level) Examination, August 2002

ඉතිහාසය I කොටස
History Part I

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1948 දක්වා**

පැය එකයි
One Hour

මෙම කොටසේ ප්‍රශ්න 40ක් ඇත. සියලු ම ප්‍රශ්න වලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි වන්නේ එයින් එකක් පමණි.
ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරා ගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
මෙම කොටසට ලකුණු 40ක් ලැබේ.
I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත්‍රය සමග අමුණා භාර දෙන්න.

## I කොටස

- **අංක 01 සිට 10 දක්වා වූ ප්‍රශ්නවලට එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දක්වා ඇත. ඒවා අතරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නො ගැළපේ. එම නො ගැළපෙන නම කුමක් දැයි හඳුනා ගෙන එහි අංකය වරහන තුළ ලියන්න.**

01. (1) මාගම (2) මාපුටු (3) මහවොට් (4) මාන්තොට්ටම් (5) මාන්තායි (..........)

02. (1) ථූපාරාමය (2) ලංකාරාමය (3) මහාපාලි (4) මිරිසවැටිය (5) අභයගිරිය (..........)

03. (1) මහා අරිට්ඨ කුමාර (2) භණ්ඩුක උපාසක (3) මල්ලගණක
(4) තිස්ස බ්‍රාහ්මණ (5) තාලිපබ්බත බ්‍රාහ්මණ (..........)

04. (1) පරුමක (2) ගපති (3) ගමික (4) රටික (5) අකලහස (..........)

05. (1) වල්ලිපුරම් රන් සන්නස (2) තිරියායි සෙල් ලිපිය (3) කොණ්ඩවට්ටවාන් ටැම් ලිපිය
(4) අලහාබාද් ප්‍රශස්තිය (5) පුලියන්කුළම ටැම් ලිපිය (..........)

06. (1) මුල්ලේරියාව (2) ගන්නොරුව (3) දන්තුරේ (4) රන්දෙනිවෙල (5) නල්ලූර් (..........)

07. (1) රාජාවලිය (2) අලකේශ්වර යුද්ධය (3) රාජසීහ හටන
(4) මන්දාරම්පුර පුවත (5) පෙරිප්ලස් ඔෆ් ද එරිත්‍රියන් සී (..........)

08. (1) රිබෙයිරෝ (2) ක්වේරොෂ් (3) බැරොස් (4) කූතෝ (5) බල්දියස් (..........)

09. (1) යාන් මාත්සුකර් (2) රයික්ලොෆ් ෆන් හූන්ස් (3) ජෙරනිමෝ ද අසවේදු
(4) ෆන් ඉම්හොෆ් (5) විලෙම් ෆැල්ක් (..........)

10. (1) පුරන් අප්පු (2) ඇහැලේපොල (3) පිළිමතලව්වේ (4) මොල්ලිගොඩ (5) රත්වත්තේ (..........)

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා නාම යුගල පහක් දක්වේ. ඒ අතර එහි එකිනෙකට නො ගැළපෙන නාම යුගලයක් ඇත. එම නො ගැළපෙන නාම යුගලය හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

11. (1) බුද්ධඝෝෂ තෙරුන් - සමන්තපාසාදිකාව (2) විමලකිත්ති තෙරුන් - සද්ධර්මරත්නාකරය
(3) මහානාම තෙරුන් - සද්ධර්මරත්නාවලිය (4) වේදේහ තෙරුන් - සමන්තකූට වණ්ණනා
(5) ධම්මකිත්ති තෙරුන් - සද්ධර්මාලංකාරය (..........)

12. (1) වලිකාමම් - වැලිගම (2) කම්මාරගාම - කඹුරුගමුව
(3) නීලවාලතිත්ථ - මාතර (4) සම්බිලිතුරෙහි - නාගදීප
(5) දේවනගර - දෙවිනුවර (..........)

13. (1) මහරජ ගමිණි අභය - ගජබාහුක ගාමණී රජු (2) උතර මහරජ - වසභ රජු
(3) මපුරුම් බුදදස් ළපරිදෙව - බුද්ධ පාරින්ද රජු (4) සරතරය - තිරීතර රජු
(5) මෙකවණ අබය - ගෝඨාභය රජු (..........)

14. (1) දෝන කැතරිනා - කුසුමාසන දේවී (2) සපුමල් කුමාරයා - හයවන බුවනෙකබාහු රජු
(3) ටිකිරි බණ්ඩාර - පළමුවන රාජසිංහ රජු (4) ඔස්ත්‍රියාවේ දොන් ජුවන් - සෙනරත් රජු
(5) කන්නසාමි - ශ්‍රී වික්‍රම රාජසිංහ රජු (..........)

Past Papers Wiki

15. (1) යෝරිස් ෆන් ස්පිල්බර්ජන් - පළමුවන විමලධර්මසූරිය රජු (2) රොබට් නොක්ස් - දෙවන රාජසිංහ රජු
(3) ජොන් පයිබස් - කීර්ති ශ්‍රී රාජසිංහ රජු (4) හියු බොයිඩ් - රාජාධිරාජසිංහ රජු
(5) රොබර්ට් ඇන්ඩෲස් - රාජාධිරාජසිංහ රජු (..........)

● අංක 16 සිට 20 තෙක් වූ එක් එක් ප්‍රශ්නයක් සඳහා නාම/ප්‍රකාශන/දින වකවානු සමූහයක් X තීරුවේ දී ඇත. Y තීරුවේ දී ඇති නාම/ප්‍රකාශන/දින වකවානු X තීරුවේ ඇති නාම/ප්‍රකාශන/දින වකවානු සමග කිසියම් ආකාරයකින් ගැළපේ. නමුත් ඒවා නිසි අනුපිළිවෙළකට දක්වා නැත. නිවැරදි පිළිවෙළට ගැළපූ විට, පහත දී ඇති සංයෝග **පහෙන්** එකක් නිවැරදි ය. නිවැරදි සංයෝගයේ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ ලියන්න.**

| | X | | Y |
|---|---|---|---|
| 16. (i) | ඩී මුන්ඩො | A. | ඇරිස්ටෝටල් |
| (ii) | කොස්මස් ඉන්ඩි කොප්ලෙස්ටස් | B. | පි-චියු-නි-චුවාං |
| (iii) | පාහියාං | C. | ක්වේරොෂ් |
| (iv) | එදා හෙළදිව | D. | රොබට් නොක්ස් |
| (v) | ලංකාධිපත්‍යය | E. | ටොලෝග්‍රිෆියා ක්‍රිස්තියානා |

(1) ABCDE (2) AEBDC (3) ACDEB (4) ACBED (5) ADECB (..........)

| | X | | Y |
|---|---|---|---|
| 17. (i) | බෝධිශාඛාව | A. | දේවානම්පිය තිස්ස රජු |
| (ii) | දළදාව | B. | ගජබා රජු |
| (iii) | ධම්මධාතු | C. | සිරිමේඝවණ්ණ රජු |
| (iv) | කේශධාතු | D. | සිලාකාල රජු |
| (v) | පත්තිනි ඇදහිල්ල | E. | පළමුවන මුගලන් රජු |

(1) ABCDE (2) AEBDC (3) ACDEB (4) ACBED (5) ADECB (..........)

| | X | | Y |
|---|---|---|---|
| 18. (i) | වල්ලිපුරම් | A. | රන්සන්නස |
| (ii) | හෝපිටිගමු | B. | කතිකාවත |
| (iii) | ගල්විහාරය | C. | ටැම්ලිපිය |
| (iv) | තෝණිගල | D. | තඹසන්නස |
| (v) | පනාකඩුව | E. | පර්වතලිපිය |

(1) ABCDE (2) AEBDC (3) ACDEB (4) ACBED (5) ADECB (..........)

| | X | | Y |
|---|---|---|---|
| 19. (i) | විද්‍යෝදය පිරිවෙන | A. | හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි |
| (ii) | විද්‍යාලංකාර පිරිවෙන | B. | රත්මලානේ ශ්‍රී ධම්මාලෝක හිමි |
| (iii) | පරම ධම්ම චේතිය පිරිවෙන | C. | වලානේ සිද්ධාර්ථ හිමි |
| (iv) | පරම විඥානාර්ථ සමාගම | D. | හෙන්රි ස්ටීල් ඕල්කට් |
| (v) | පානදුරා වාදය | E. | මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමි |

(1) ABCDE (2) AEBDC (3) ACDEB (4) ACBED (5) ADECB (..........)

| | X | | Y |
|---|---|---|---|
| 20. (i) | ෆෙඩ්රික් නෝර්ත් | A. | ශ්‍රී ලංකාවේ ප්‍රථම බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයා වීම. |
| (ii) | රොබට් බ්‍රවුන්රිග් | B. | බහුභාර්යා සේවනය අවලංගු කිරීම. |
| (iii) | විලියම් ග්‍රෙගරි | C. | මහනගර සභා පිහිටුවීම. |
| (iv) | හර්කියුලීස් රොබින්සන් | D. | උඩරට රාජධානිය බ්‍රිතාන්‍යයන් විසින් ඈඳාගනු ලැබීම. |
| (v) | හෙන්රි වෝර්ඩ් | E. | කොළඹ කෞතුකාගාරය පිහිටුවීම. |

(1) ABCDE (2) AEBDC (3) ACDEB (4) ACBED (5) ADECB (..........)

● අංක 21 සිට 25 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති A, B, C සහ D යන ප්‍රතිචාර **හතර** අතරෙන් **එකක්** හෝ **කිහිපයක්** හෝ නිවැරදි ය. **නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,**

A සහ B පමණක් නිවැරදි **නම් 1 ද,**
B සහ C පමණක් නිවැරදි **නම් 2 ද,**
C සහ D පමණක් නිවැරදි **නම් 3 ද,**
A සහ C පමණක් නිවැරදි **නම් 4 ද,**
ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් 5 ද **වරහන් තුළ ලියන්න.**

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදි ය. | B සහ C පමණක් නිවැරදි ය. | C සහ D පමණක් නිවැරදි ය. | A සහ C පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි ය. |

21. ශ්‍රී ලංකාවේ ආර්ය ජනාවාස පිහිටුවීම හා සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) දිවයිනේ සාම්ප්‍රදායික ඉතිහාසය විජය පිළිබඳ පුරාවෘත්තයෙන් ආරම්භ වේ.
(B) විජයගේ අමාත්‍යවරු සිය නම් යොදා ජනාවාස පිහිට වූහ.
(C) කුවේණි වෘතාන්තය දීපවංසය සවිස්තරාත්මකව දක්වා ඇත.
(D) මදුරාපුරයේ සිට පැමිණි කුමරියගේ කථාව මහාවංසය සඳහන් නොකරයි. (..........)

22. වාරිමාර්ග පද්ධතියේ වර්ධනයට මහසේන රජුගේ දායකත්වය පිළිබඳව පහත දැක්වෙන කවර සාධකය / සාධක නිවැරදි වේ ද?
(A) ඇළහැර යෝධ ඇළ ඉදිකිරීමේ ගෞරවය මහසෙන් රජුට හිමි වේ.
(B) මහසෙන් රජු වැව් 11 ක් සහ ඇළමාර්ග 12 ක් තැනවී ය.
(C) මහසෙන් රජු විසින් කරවන ලද ඉතාම ප්‍රසිද්ධ වැව මින්නේරිය වැව ය.
(D) ඇළහැර - මින්නේරි - කවුඩුලු ව්‍යාපාරය සම්පූර්ණ කරන ලද්දේ මහසෙන් රජුගේ පාලන සමයේ දී ය. (..........)

23. චෝළයන් අනුරාධපුරයේ සිට පොළොන්නරුවට අගනගරය මාරු කිරීමට මෙහෙය වූ සාධක හා සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර හේතුව / හේතුන් නිවැරදි වේ ද?
(A) පොළොන්නරුව ඒ වන විට විදේශික ජනාවාසයක් වීම. (B) මහවැලි නදියෙන් පොළොන්නරුව ආරක්ෂා වීම.
(C) රුහුණේ කැරළිකාර ප්‍රදේශවල පාලනය පහසු කර වීම. (D) පොළොන්නරුව සුරක්ෂිත වීම. (..........)

24. කෝට්ටේ රාජ්‍යයේ පෘතුගීසි බලය ස්ථාපිතවීම කෙරෙහි බලපෑ ප්‍රධාන සාධකය / සාධක හා සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර කාරණය / කරුණු නිවැරදි වේ ද?
(A) පෘතුගීසීන්ගේ උසස් හමුදා බල
(B) පෘතුගීසීන් කෙරෙහි පළමුවන රාජසිංහ රජු දැක්වූ අනුකම්පාව
(C) කෝට්ටේ පාලකයන්ගේ දුර්වලතා
(D) උඩරටියන්ගේ පක්ෂපාතීත්වය (..........)

25. 1848 බ්‍රිතාන්‍ය විරෝධී ජනතා නැඟී සිටීම කෙරෙහි බලපෑ සාධකය / සාධක හා සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ
(B) කෝපි වගාව ආරම්භ කිරීම
(C) අලුත් බදු පැනවීම
(D) 1815 උඩරට ගිවිසුම (..........)

● අංක 26 සිට 30 දක්වා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

26. පහත සඳහන් පිරිවෙන් අතරෙන් කෝට්ටේ යුගයේ ප්‍රකට අධ්‍යාපන මධ්‍යස්ථානය වූයේ කවරක් ද?
(1) මහා විහාර පිරිවෙන
(2) දික්සඳ සෙනෙවියා පිරිවෙන
(3) පද්මාවතී පිරිවෙන
(4) ආළාහන පිරිවෙන
(5) පරම ධම්ම චේතිය පිරිවෙන (..........)

27. දඹදෙණි යුගයේ පාලකයින්ගේ කාලය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය නිවැරදි වේ ද?
(1) ධර්මසේන හිමි විසින් සද්ධර්මරත්නාවලිය ලිවීම.
(2) ශ්‍රී රාහුල මාහිමි විසින් සැළලිහිණි සන්දේශය ලිවීම.
(3) ගඩලාදෙණිය සහ ලංකාතිලක යන විහාර ඉදිකිරීම.
(4) සපුමල් කුමාරයා යාපා පටුන යටත් කිරීම.
(5) දෙවන පරාක්‍රමබාහු රජු ශ්‍රී ලංකාව එක්සේසත් කිරීම. (..........)

28. ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් බවට පත්වූයේ කවර වර්ෂයේ ද?
(1) 1796 (2) 1798 (3) 1802 (4) 1815 (5) 1818 (..........)

29. බ්‍රිතාන්‍ය යුගයේ දී ශ්‍රී ලංකාව පාලනය කළ ආණ්ඩුකාරවරුන්ගේ නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන්නේ පහත සඳහන් කවර කාණ්ඩයේ ද?
(1) එඩ්වඩ් බාර්න්ස්, විල්මට් හෝර්ටන්, ස්ටුවට් මැකන්සි, කොලින් කැම්බල්, ටොරින්ටන් සාමි
(2) එඩ්වඩ් බාර්න්ස්, ටොරින්ටන් සාමි, කොලින් කැම්බල්, ස්ටුවට් මැකන්සි, විල්මට් හෝර්ටන්
(3) එඩ්වඩ් බාර්න්ස්, කොලින් කැම්බල්, ස්ටුවට් මැකන්සි, විල්මට් හෝර්ටන්, ටොරින්ටන් සාමි
(4) එඩ්වඩ් බාර්න්ස්, ස්ටුවට් මැකන්සි, ටොරින්ටන් සාමි, විල්මට් හෝර්ටන්, කොලින් කැම්බල්
(5) එඩ්වඩ් බාර්න්ස්, විල්මට් හෝර්ටන්, ටොරින්ටන් සාමි, කොලින් කැම්බල්, ස්ටුවඩ් මැකන්සි (..........)

30. සර්වජන ඡන්දය ප්‍රදානය කිරීම ප්‍රකාශයට පත් කරන ලද්දේ පහත දැක්වෙන කවර ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ ද?
(1) කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ
(2) කෲ - මැකලම් ප්‍රතිසංස්කරණ
(3) මැනිං - ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණ
(4) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ
(5) සෝල්බරි ප්‍රතිසංස්කරණ (..........)

● අංක 31 සිට 35 තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතරින් එකක් අදාළ මාතෘකාවට **නො ගැළපේ**. එම කරුණ තෝරා ඊට **අදාළ අංකය වරහන තුළ** ලියන්න.

31. ශ්‍රී ලංකාවට බුද්ධාගම හඳුන්වා දීම
(1) මහා සඞ්ඝයාට මහාමේඝවන උද්‍යානය ප්‍රදානය කිරීම.
(2) මහා විහාරය පිහිටුවීම.
(3) හේමමාලි කුමරිය විසින් දන්ත ධාතුව රැගෙන ඒම.
(4) භික්ෂු ශාසනය පිහිටුවීම.
(5) සංඝමිත්තා තෙරණියගේ පැමිණීම. (..........)

Past Papers Wiki

32. දකුණු ඉන්දීය ආක්‍රමණ
   (1) අසේල රජුගේ පාලන සමයේ දී ඇති වූ සේන-ගුත්තික ආක්‍රමණය.
   (2) සේන සහ ගුත්තික එකතු වී අවුරුදු 22 ක් රාජ්‍ය විචාරීම.
   (3) චෝළ රටින් පැමිණි එළාර කුමාරයා අසේල රජුගෙන් රාජ්‍ය පැහැර ගැනීම.
   (4) එළාර රජු අවුරුදු 44 ක් රාජ්‍ය විචාරීම.
   (5) වට්ටගාමිණී අභය රජුගේ පාලන සමයේ දී ඇති වූ දකුණු ඉන්දීය ආක්‍රමණය. (..........)

33. පොළොන්නරු යුගයේ කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය
   (1) පොළොන්නරු යුගයේ ගෘහ නිර්මාණ ශිල්පයේ සුවිශේෂ ලක්ෂණ වඩාත් ම හොඳින් ප්‍රකාශ වනුයේ ආගමික ගොඩනැගිලිවලිනි.
   (2) ලෞකික ගොඩනැගිලිවල නටබුන් අනුරාධපුර යුගයට වඩා පොළොන්නරු යුගයේ දී දක්නට ඇත.
   (3) පොළොන්නරු යුගයේ ශ්‍රේෂ්ඨතම මූර්ති කලා නිර්මාණ ලෙස ගල් විහාර ප්‍රතිමා සැලකිය හැකි ය.
   (4) අවුකන බුදු පිළිමය මේ යුගයේ දී ඉදි කෙරිණ.
   (5) හැටදාගෙය පොළොන්නරුවේ ඇති විශේෂ ලක්ෂණ සහිත ගොඩනැගිල්ලකි. (..........)

34. නායක්කර් පෙළපත
   (1) ප්‍රථම රජු ශ්‍රී විජය රාජසිංහ ය.
   (2) ශ්‍රී විජය රාජසිංහ රජු රටවැසියන් විසින් හඳුන්වනු ලැබුවේ කුණ්ඩසාලේ දෙවියෝ නමිනි.
   (3) කීර්ති ශ්‍රී රාජසිංහ රජු බුද්ධාගමේ සහ බෞද්ධ සංස්කෘතියේ ශ්‍රේෂ්ඨ අනුග්‍රාහකයෙකි.
   (4) නායක්කාර් පෙළපතේ රජුන්ගෙන් තුන්වෙනුවට හා හතරවෙනුවට ආ සොහොයුරන් දෙදෙනා හැර සෙසු අය විවිධ පවුල්වලට අයත් වූහ.
   (5) දකුණු ඉන්දීය පවුල් සමග නායක්කාර් රජුන් පවත්වාගෙන ගිය විවාහ සම්බන්ධතා නිසා ම දහ අටවන ශතවර්ෂය මැද වන විට මහනුවර නායක්කාර් ජනපදයක් බිහි විය. (..........)

35. 1815 උඩරට ගිවිසුම
   (1) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු උඩරට සිහසුනෙන් පහ කෙරිණ.
   (2) උඩරට රදළ ප්‍රධානීන්ගේ බලතල හා වරප්‍රසාද ආරක්ෂා කෙරිණ.
   (3) බුද්ධාගම සහ දේව ආගම කඩ කළ නොහැකි බවට ප්‍රකාශ කෙරිණ.
   (4) උඩරට හා මුහුදුබඩ ප්‍රදේශ සම්බන්ධ කොට ඒකාබද්ධ පරිපාලන තන්ත්‍රයක් ඇති කෙරිණ.
   (5) උඩරට රාජධානියට අයත් වූ ප්‍රදේශ බ්‍රිතාන්‍ය කිරුළ යටතට ගෙනෙන ලදී. (..........)

- අංක 36 සිට 40 දක්වා වූ ප්‍රශ්නවලට ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති යුගලයට හොඳින් ගැළපෙනුයේ පහත වගුවෙහි දක්වෙන 1, 2, 3,4 සහ 5 යන කවර විග්‍රහය දැයි තෝරා **අංකය වරහන තුළ ලියන්න.**

| | පළමුවෙනි ප්‍රකාශය | දෙවෙනි ප්‍රකාශය |
|---|---|---|
| 1. | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2. | නිවැරදි ය. | වැරදි ය. |
| 3. | වැරදි ය. | වැරදි ය. |
| 4. | වැරදි ය. | නිවැරදි ය. |
| 5. | නිවැරදි ය. | නිවැරදි ය. පළමු ප්‍රකාශය මැනවින් පහදා දෙයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| 36. | පැරණි ලක්දිව අලුත් රජ කෙනෙකු පත්කිරීමේ දී අභිෂේක උත්සවයක් පවත්වන ලදී. | සාම්ප්‍රදායික නීති රීති හා සංස්ථා ආරක්ෂා කිරීම රජු විසින් කළ යුතු කාර්යයන් ලෙස සලකනු ලැබී ය. | (........) |
| 37. | ආරෝග්‍යශාලා පිහිටුවා පවත්වාගෙන යෑම ශ්‍රී ලංකා සභ්‍යත්වයේ වැදගත් ලක්ෂණයක් විය. | දක්ෂ වෛද්‍යවරයෙකු ලෙස ප්‍රසිද්ධව සිටි සිරි සංඝබෝධි රජු ගමක් ගමක් පාසා ආරෝග්‍යශාලා කරවී ය. | (........) |
| 38. | පළමුවන පරාක්‍රමබාහු රජු පාණ්ඩ්‍ය රජුට උපකාර කිරීම සඳහා 1169 දී දකුණු ඉන්දියාවට හමුදාවක් යැවී ය. | මෙය මූලික වශයෙන් දකුණු ඉන්දියාවේ චෝළ බලයට විරුද්ධව දුර්වල පාලකයන්ට ආධාර කිරීමේ ශ්‍රී ලංකා සාම්ප්‍රදායික ප්‍රතිපත්තිය ඉදිරියට ගෙන යෑමකි. | (........) |
| 39. | 1817 - 1818 වර්ෂවල දී උඩරට ප්‍රදේශවල බ්‍රිතාන්‍ය විරෝධී කැරැල්ලක් ඇති විය. | ප්‍රධාන වශයෙන් උඩරැටියන් අතර බ්‍රිතාන්‍ය පාලනයට එරෙහි ව පැවති කලකිරීම හේතු කොට ගෙන ඇති වූ මේ කැරැල්ල ඔවුන් විසින් දරුණු ලෙස මර්දනය කරන ලදී. | (........) |
| 40. | 1947 පෙබරවාරි 04 වන දින ශ්‍රී ලංකාවට නිදහස ප්‍රදානය කරන ලදී. | අමාත්‍ය මණ්ඩලයේ කෙටුම් පතේ සහ සෝල්බරි කොමිසමේ යෝජනා බොහෝ දුරට එක හා සමාන විය. | (........) |

PAST PAPERS WIKI

Past Papers Wiki

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2002 අගෝස්තු
General Certificate of Education(Advanced Level) Examination, August 2002

ඉතිහාසය I කොටස
History Part I

ශ්‍රී ලංකාවේ ඉතිහාසය ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1948 දක්වා

පැය දෙකයි
Two Hours

10 වන ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න

## II කොටස

01. මහසෙන් රජුගේ රාජ්‍ය කාලය අවසානය තෙක් මහාවංසය ඓතිහාසික මූලාශ්‍රයක් වශයෙන් වැදගත් වන ආකාරය පහත දී ඇති මාතෘකාවලින් **එකක්** ඇසුරෙන් ප්‍රමාණ කරන්න.
   (i) දේවානම්පිය තිස්ස රජුගේ රාජ්‍ය කාලයේ සිට මහසෙන් රජුගේ රාජ්‍ය කාලය අවසානය තෙක් දිවයිනේ දේශපාලන ඉතිහාසය
   (ii) ඉහත කී කාලපරිච්ඡේදයේ රජුන්ගේ ආගමික හා සංස්කෘතික කටයුතු (ලකුණු 14 යි)

02. පහත දී ඇති මාතෘකාවලින් ඕනෑම **දෙකක්** අළලා සටහන් ලියන්න.
   (i) බදුල්ල (හොර්පිටිගමුව) පුවරු ලිපිය
   (ii) ස්තූපයේ ප්‍රධාන අංග
   (iii) අනුරාධපුර රාජධානියේ රජවරුන්ගේ ප්‍රධාන ආදායම් මාර්ග
   (iv) රටේ ආර්ථික සංවර්ධනය සඳහා වසභ රජුගෙන් සිදුවූ සේවාව (එක් කොටසකට ලකුණු 07 බැගිනි.)

03. පහත දක්වා ඇති සිද්ධීන්ගෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම ප්‍රමාණ කරන්න.
   (i) ශ්‍රී මාර ශ්‍රී වල්ලභ පාණ්ඩ්‍ය අධිරාජයාගේ ශ්‍රී ලංකා ආක්‍රමණය
   (ii) පළමුවන පරාක්‍රමබාහු රජුගේ දකුණු ඉන්දියා ආක්‍රමණය
   (iii) පළමුවන පරාක්‍රමබාහු රජුගේ කාලයේ දී ඇති කරන ලද සංඝ සාමග්‍රිය
   (iv) කාලිංග මාඝගේ ආක්‍රමණය (එක කොටසකට ලකුණු 07 බැගිනි.)

04. දෙවන පරාක්‍රමබාහු රජුගේ දේශපාලන හා සංස්කෘතික කාර්ය සංසිද්ධීන් සැකෙවින් සාකච්ඡා කරන්න. (ලකුණු 14 යි)

05. කෝට්ටේ යුගයේ අධ්‍යාපනික හා සාහිත්‍යයික කටයුතු අළලා රචනයක් ලියන්න. (ලකුණු 14 යි)

06. ශ්‍රී ලංකාවේ මුහුදු බඩ පළාත්වල පෘතුගීසි සහ ලන්දේසි පාලනයෙන් ඇති වූ බලපෑම පහත දැක්වෙන ඕනෑම මාතෘකා **දෙකක්** ඇසුරෙන් ප්‍රමාණ කරන්න.
   (i) පරිපාලන හා අධිකරණ සංවිධානය
   (ii) ආර්ථික වෙනස් වීම්
   (iii) ආගමික ප්‍රතිපත්තිය
   (iv) සමාජ සහ සංස්කෘතික වෙනස් වීම් (එක කොටසකට ලකුණු 07 බැගිනි.)

07. උඩරට රාජධානියේ වර්ධනයෙහි ලා පළමුවන විමලධර්මසූරිය රජු විසින් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ගයේ වැදගත්කම පහත දැක්වෙන මාතෘකා යටතේ සාකච්ඡා කරන්න.
   (i) උඩරට රාජ්‍යයේ ස්වාධීනත්වය තහවුරු කිරීම
   (ii) රජුගේ ආගමික ප්‍රතිපත්තිය (ලකුණු 14 යි)

08. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය යටතේ වතු ආර්ථිකයේ ව්‍යාප්තියේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූ වෙනස්වීම් පහත සඳහන් ක්ෂේත්‍ර අතරින් ඕනෑම **දෙකක්** යටතේ පරීක්ෂා කරන්න.
   (i) ප්‍රවාහන කටයුතු
   (ii) දේශීය කෘෂිකර්මාන්තය
   (iii) ආනයන හා අපනයන වෙළෙඳාම
   (iv) ඉඩම් අයිතිය හා භුක්තිය
   (v) කම්කරු පන්තිය
   (vi) උඩරට සමාජය
   (එක කොටසකට ලකුණු 07 බැගිනි.)

09. පහත දැක්වෙන මාතෘකා අතරින් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ සටහන් ලියන්න.
   (i) 1848 බ්‍රිතාන්‍ය විරෝධී නැගිටීම
   (ii) දහනවවන සියවසේ අග භාගයේ ඇති වූ බෞද්ධ හා හින්දු සංස්කෘතික පුනරුදය
   (iii) 1915 සිංහල - මුස්ලිම් කෝලාහලය
   (iv) සර්වජන ඡන්දබලය ප්‍රදානය කිරීම (එක කොටසකට ලකුණු 07 බැගිනි)

10. ඔබට සපයා ඇති සිතියමෙහි
   අංක 1 ගංගාවකි,
   අංක 2 පැරණි අග නගරයකි,
   අංක 3 පළමුවන විජයබාහු රජුගෙන් පසුව රට බෙදා තිබූ පාලන කොටස් හතරෙන් එකකි,
   අංක 4 වසභ රජුගේ ඇමතියෙකු විසින් පාලනය කරන ලද ප්‍රදේශයෙන් කොටසකි,
   අංක 5 හත්වන බුවනෙකබාහු රජු ඝාතනය කරන ලද ස්ථානයයි,
   අංක 6 උඩරට රාජධානිය සතුව පැවති වරායකි,
   අංක 7 නූතන ශ්‍රී ලංකාවේ පළාතකි,
   අංක 8 මහවැලි ගඟ හරස්කොට බඳින ලද අමුණකි.
   මේ සියලු ම ස්ථාන ඔබට සපයා ඇති සිතියමෙහි **නම්** කොට ඉන් **දෙකක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.
   (නම් කිරීමට ලකුණු **එක** බැගිනි. කෙටි සටහනකට ලකුණු **පහ** බැගිනි.)

PAST PAPERS WIKI




අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2002 අගෝස්තු
General Certificate of Education(Advanced Level) Examination, August 2002

ප්‍රශ්න අංකය 10

විභාග අංකය.......................................................

# ශ්‍රී ලංකාව




WWW.PastPapers.WiKi



Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library